**මහියංගණය ප්‍රාදේශීය සභාව**
**බදුල්ල දිස්ත්‍රික්කය**
--------------------------------

1. **මූල්‍ය ප්‍රකාශන**
-----------------

1.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
--------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 18 දිනද ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 31 දිනද විගණනයට ඉදිරිපත් කර තිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 ජූලි 08 දින සභාවේ ලේකම්වරයා වෙත යවා ඇත.

1.2 **මතය**
-------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට මහියංගණය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
----------------------------------------

1.3.1 **ගිණුම්කරණ අඩුපාඩු**
------------------------

පහත දැක්වෙන අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දී සභාව විසින් ඉදිකරන ලද ගොඩනැගිල්ලේ වටිනාකම වූ රු.328,422 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ආ) පළාත් සභාව විසින් රු.712,000 කට වෙන්දේසි කරන ලද සභාවට අයත් නොවන කැබ් රථයක වෙන්දේසි ආදායම ලැබිය යුතු ආදායමක් ලෙස ගිණුම්ගතකර තිබුණි.

(ඇ) ඉකුත් වර්ෂය සඳහා වැඩියෙන් වෙන්කර තිබූ රු. 361,873 ක මුද්දර ගාස්තු ආදායම් සමුච්චිත අරමුදලට ගැලපීම් කර නොතිබුණි.

(ඈ) ඉකුත් වර්ෂය සඳහා අඩුවෙන් වෙන්කර තිබූ රු.1,111,929 ක උසාවි දඩ ආදායම සමුච්චිත අරමුදලට ගැලපීම් කර නොතිබුණි.

1.3.2 **නොසැසඳූ පාලන ගිණුම්**
--------------------------

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන දේශීය ණය හා සංවර්ධන අරමුදලේ ණය ශේෂය හා උපයෝගී ලේඛන සමඟ රු.232,583 කින් නොසැසඳුණි.

1.3.3 **ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**
----------------------------------

ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු. 18,074,709 ක් වූ අතර, එදිනට ගෙවිය යුතු ගිණුම් ශේෂ වල වටිනාකම රු.15,282,158 ක් විය.

1.3.4 **විගණනය සඳහා සාක්ෂි නොවීම**

-----------------------------------

රු.103,348,467 ක් වටිනා ගිණුම් විෂයයන් 05 ක්, උපලේඛන, ස්ථාවර තැන්පත් ලේඛන, තැන්පත් නිදහස් කිරීම්/ලැබීම් පිළිබඳ විස්තර, තොග සත්‍යාපන වාර්තා, බදු තැන්පතු ලේඛනය හා ජාතිය ගොඩනැගීමේ බදු තැන්පතු ලේඛනය ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේ දී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

1.3.5 **නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

----------------------------------------------

විගණනයේ දී නිරීක්ෂණය වූ නීති, රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| **නීති, රීති, රෙගුලාසිවලට යොමුව** | **අනුකූල නොවීම්** |
|---|---|
| (අ) 1987 ප්‍රාදේශීය අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | |
| (i) 132(ඒ) වගන්තිය | විෂයභාර අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය යටතේ දැරිය යුතු රු.14,725 ක වියදම් සඳහා අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය ලබාගෙන නොතිබුණි. |
| (ii) 147(1) (ඈ) වගන්තිය | පළාත් සභාව විසින් යෝජනා සම්මතයක් මඟින් ස්ථිර කර ගැසට් නිවේදනයක් මඟින් ප්‍රකාශ කිරීමකින් තොරව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ රථ වාහන ගාල් කිරීම වෙනුවෙන් රු.57,000 ක ගාස්තුවක් අයකර තිබුණි. |
| (ආ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති සංග්‍රහය | |
| (i) 115 වන රීතිය | රු.65,695 ක් වටිනා විදුලි උපාංග සඳහා 2015 දෙසැම්බර් 14 දින ගෙවීම් සිදුකර තිබුනද, 2016 මාර්තු 31 වන විටත් එම භාණ්ඩ ලැබී නොතිබුණි. |
| (ii) 177 වන රීතිය | අවශ්‍යා සැලසුම් පිරිවිතර හා මිල කැඳවීම්, ප්‍රමාණ පත්‍ර සකස් නොකර රු.223,280 ක් වටිනා වීථි ලාම්පු 140 ක් මිලදී ගෙන ස්ථාන ගතකර තිබුණි. |
| (iii) 180 වන රීතිය | නිලධාරීන් 05 දෙනෙකු විසින් එකතුව රු.30,000 ක් වූ සේවක ඇප තැන්පත් කර නොතිබුණි. |
| (iv) 212 වන රීතිය | වීථි ලාම්පු 140 ක් සවිකිරීමට අදාලව මිලදී ගත් රු.223,280 ක් වටිනා භාණ්ඩ, තොග පොත්වල ඇතුළත් කොට නොතිබුණි. |
| (v) 218 වන රීතිය | සමාලෝචිත වර්ෂයට අදාලව සභාව විසින් වත්කම් පිළිබඳ සමීක්ෂණ කටයුතු සිදු කර නොතිබුණි. |

(ඇ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි
-------------------------------------

| | | |
|---|---|---|
| (i) | මුදල් රෙගුලාසි 260 | වීථි ලාම්පු 140 ක් මිලදී ගැනීම වෙනුවෙන් ගෙවිය යුතු රු.223,280 ක මුදල වෙනුවෙන් නිකුත් කළ චෙක්පතේ ආදායකයා ලෙස අදාල ආයතනය වෙනුවට පුද්ගලික නමක් සඳහන් කර තිබුණි. |
| (ii) | මුදල් රෙගුලාසි 571 | අවස්ථා 06 කදී තැන්පත් කරන ලද එකතුව රු.63,500 ක් වූ කල් ඉකුත් වූ තැන්පතු ආදායමට බැර කරනොතිබුණි. |

| | | |
|---|---|---|
| (ඈ) | ශ්‍රී ලංකා ජනරජයේ ආයතන XXIV වන 4:6 වගන්තිය | ස්ථාන මාරුවීම් ලැබූ හා සේවය හැර ගිය නිලධාරීන් 16 සංග්‍රහයේ දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.33,711 ක් වූ පරිච්ඡේදයේ සේවක ණය අයකරගෙන නොතිබුණි. |

2. **මූල්‍ය සමාලෝචනය**
-----------------------

2.1 **මූල්‍ය ප්‍රතිඵල**
--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.13,292,071 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.5,411,275 ක් විය.

2.2 **ආදායම් පරිපාලනය**
---------------------

2.2.1 **ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**
------------------------------------

(අ) 2015 දෙසැම්බර් 31 දිනට ඉකුත් වර්ෂයන්ට අදාලව ප්‍රාදේශීය සභා අරමුදලට ලැබිය යුතු හිඟ හිටි ආදායම රු.2,729,109 ක් වූ අතර, සමාලෝචිත වර්ෂය සඳහා බිල්කල ආදායමෙන් රු.2,884,466 ක් එනම් 94 % ක් එදිනට හිඟව පැවතුණි.

(ආ) අංක 02 - මුහුදු මාළු තට්ටුව සඳහා 2014 මාර්තු සිට 2014 දෙසැම්බර් දක්වා බදුකරු විසින් කුලී මුදල් නිසි පරිදි නොගෙවීම මත කුලී හා දඩ වශයෙන් රු.112,700 ක් සභාව වෙත අයවිය යුතුව තිබුණි.

2.2.2 **උසාවි දඩ හා මුද්දර ගාස්තු**
-----------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2015 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ වෙනුවෙන් රු. 3,845,558 ක මුදලක් සහ මුද්දර ගාස්තු වෙනුවෙන් රු. 1,875,549 ක මුදලක් අයවිය යුතුව තිබුණි.

3. **මෙහෙයුම් සමාලෝචනය**
---------------------------

3.1 **මෙහෙයුම් අකාර්යක්ෂමතා**
-----------------------------

සභාව සතු ආදායම් ඉපයිය හැකි ලංගම බස් නැවතුම්පළ ඉදිරිපිට ගොඩනැගිල්ලේ හා තවත් පුද්ගලික ගොඩනැගිල්ලක පවතින පොදු වැසිකිළි 02 ක් බාහිර පුද්ගලයන් දෙදෙනෙකු විසින් අනවසරයෙන් පවත්වාගෙන යනු ලබන අතර එම වැසිකිළි සඳහා අවශ්‍ය ජලය හා අපද්‍රව්‍ය ඉවත් කිරීමේ කටයුතු සභාවේ වියදමින් සිදුකරනු ලබන බව නිරීක්ෂණය විය.

3.2 **ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය**

පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශයේ ජාතික ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ සහායක මධ්‍යස්ථානයේ ප්‍රතිපාදන මත 2014 වර්ෂයේ රු.9,026,621 ක් වැයකර ඉදිකළ කසල කළමනාකරණ ව්‍යාපෘතියේ ගොඩනැගිලි පරිශ්‍රය හා ඒ සඳහා ලද රු.334,132 ක් වූ හලර් යන්ත්‍රය භාවිතයට නොගෙන දෛනිකව එකතු කරන කසල හා ඝණ අපද්‍රව්‍ය මහවැලි ගඟ ආශ්‍රිත ප්‍රදේශයකට බැහැර කිරීමට සභාව කටයුතු කර තිබුණි.

**3.3 කොන්ත්‍රාත් පරිපාලනය**

වන අලි ගහන ප්‍රදේශයක ඉදිකළ කසල ව්‍යාපෘති පරිශ්‍රය සඳහා අලි වැටක් වෙනුවට කම්බි දැල් සහිත යකඩ වැටක් සැලසුම් කර ඉදිකර තිබූ අතර, වන අලින් විසින් එයට හානි සිදුකිරීම මත සිදුවී තිබූ පාඩුව රු.2,904,702 ක් විය.

කසල ව්‍යාපෘතිය සඳහා ළිඳක් ඉදිකිරීම වෙනුවෙන් රු.237,203 ක් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණද, ළිඳ ඉදිකර නොතිබුණි.

4. **යහපාලනය හා ගිණුම් කටයුතු භාවය**

4.1 **අයවැය පාලනය**

සභාව විසින් සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු අයවැය ලේඛනයෙහි ආදායම් හා වියදම් පාලනයේ දී අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් වශයෙන් උපයෝගී කරගෙන නොතිබුණි.

4.2 **වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම**

ප්‍රාදේශීය සභාව වාර්ෂිකව ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර භාවිතා කළ යුතු වුවත්, එසේ කර නොතිබුණි.

4.3 **අභ්‍යන්තර විගණනය**

2015 වර්ෂය සඳහා ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකොට නොතිබුණි.

4.4 **විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කිරීම**

සමාලෝචිත වර්ෂයේ විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා නොතිබුණි.

4.5 **වත්කම් කළමනාකරණය**

**නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

ප්‍රාදේශීය සභාව සතුව ඇති වාහන 18 ක් සඳහා රියදුරන් නොමැති වීමෙන් එම වාහන ඌන උපයෝජිතව පැවතුණි.

5. **පද්ධති හා පාලන**

-------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) අයවැය පාලනය
(ඇ) ආදායම් පරිපාලනය
(ඈ) කොන්ත්‍රාත් පරිපාලනය
(ඉ) ගබඩා පාලනය